වගා සහනාධාර චක්‍රලේඛ අංක : 58

අපේ අංකය : සං/ප්‍රති/ 01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
2001.11.19 දින.

158

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

## කට්ටි වශයෙන් තේ නැවත වගාව

**චක්‍රලේඛයේ පරමාර්ථය**

I. සම්පූර්ණයෙන්ම නැවත වගා කළ යුතු තත්ත්වයේ නොමැති එහෙත් කිසියම් දලු ප්‍රමාණයක් නෙලාගත හැකි ඉඩම්වල නැවත වගාවට කළයුතු ආයෝජන සහ පවතින වගාවෙන් ලැබෙන ආදායම සලකා නැවත වගාවට යොමු නොවන ඉඩම් සංවර්ධනය කරගැනීමට පෙළඹවීම.

II. පාළු අධික සංඛ්‍යාවක් පිහිටීම මත අධිකාරියේ පාළු සැපයීමේ ආධාර ක්‍රමයට සහභාගීවීමට සුදුසුකම් නොමැති ඉඩම් සංවර්ධනය කර ගැනීමට අවස්ථාවන් සලසා දීම.

III. තේ සංවර්ධන ව්‍යාපෘති ණය ක්‍රමය යටතේ කට්ටි වශයෙන් නැවත වගාවට ඇතුලත් වීමට සුදුසුකම් ලැබුවද ණය ලබාගැනීමේ දුෂ්කරතාවය මත සංවර්ධනය සඳහා යොමු නොවීම නිසා එම ඉඩම් කට්ටි වශයෙන් තේ වගා කිරීම යටතේ සංවර්ධනයට යොමු කිරීම.
ඉහත පරමාර්ථ ක්‍රියාත්මක කිරීම තුලින් කුඩා ඉඩම්වලින් උපරිම ඵලදායිතාවයක් ලබාදීම මෙම චක්‍රලේඛයේ පරමාර්ථය වේ.

**ක්‍රියා මාර්ගය**

මෙම ක්‍රමය පිළිබඳව අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන්. සමිති සහ කුඩා තේ වතු හිමියන් දැනුවත් කර ව්‍යාප්ති සේවාව තුලින් හෝ සමිති තුලින් හෝ වාර්ෂික ඉල්ලුම් පත්‍ර කැඳවීම තුලින් ලැබෙන ඉල්ලීම් අනුව සුදුසු ඉඩම් තෝරාගත හැක.

**ඉඩම් යෝග්‍යතාවය**

ඉඩම් යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර, එම අවශ්‍යතා සපුරාලිය යුතුව ඇත.

I. අධිකාරියේ නැවත වගා හෝ පාළු වගා ආධාර ක්‍රමය යටතේ සංවර්ධනය කිරීමට සුදුසුකම් ලබන ඉඩම් මේ යටතේ සැලකිය යුතු නොවේ.

II. ඉතිරි කරනු ලබන කට්ටිවලට අයත් පඳුරු වලින් ප්‍රමාණවත් ලෙස දලු නෙලාගත හැකි වියයුතු අතර, ඒවා සිහින් කොළ සහිත චීන වර්ගයේ බීජ තේ නොවිය යුතුය.

III. නැවත වගා කිරීමට අපේක්ෂිත කට්ටියක් දල වශයෙන් වර්ග අඩි 100 ක පමණ බිම් ප්‍රමාණයකින් සමන්විත විය යුතු අතර, එවැනි කට්ටිවල මුළු බිම් ප්‍රමාණයේ එකතුව අක්කර එක (වර්ග අඩි 43560) කට නොවැඩි විය යුතු අතර, පර්චස් 20 (වර්ග අඩි 5445) කට නොඅඩු විය යුතුය.

IV. ඉඩමේ අනෙකුත් තාක්ෂණීකාර්මික කටයුතු පිරිහී ගොස් ඇත්නම් ඒ සියල්ල සතුටුදායක ලෙස නැවත ස්ථාපිත කොට නඩත්තු කිරීමට එකඟ විය යුතුය.

**ක්‍රියා පිළිවෙත**

I. අධිකාරයේ නැවත වගා ආධාර ක්‍රමය යටතේ වූ කාර්යාල ක්‍රියාමාර්ග මේ සම්බන්ධයෙන්ද අනුගමනය කළයුතු අතර, නැවත වගා ආධාර ක්‍රමය යටතේ භාවිතා කෙරෙන ආකෘති පත්‍ර මෙහිදීද යොදාගත යුතුය.

II. වාර්තා තබාගැනීම සහ අධීක්ෂණය පහසු කිරීම පිණිස මෙහිදී අවසර පත්‍රයේ ආධාර ක්‍රමය හැඳින්වීමට යොදන සංකේතාක්ෂර B R (ස.නැ) අකුරු මුල්කරගත් අවසර පත්‍ර අංක ලබාදිය යුතුය.

III. ආධාර මුදල් ගෙවීමේදී නැවත වගා ආධාර මුදලේ අනුපාතිකය මත ගණනය කර ගෙවීම් කළයුතු අතර, ඒ සඳහා නැවත වගා ආධාර ගෙවීමේ ක්‍රමය අනුගමනය කළ යුතුය.

මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව කටයුතු කරන බවත් මා වෙත වාර්තා කරන්න.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත් :

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ මුදල්)
2. වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)
3. සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති/පරිපාලන)
4. අභ්‍යන්තර විගණක
5. මුදල් කළමනාකරු
6. සියලුම සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්
7. සියලුම ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීන්
8. සියලුම ජ්‍යෙෂ්ඨ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
9. සභාපති/ලේකම් - සමස්ත ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය
10. ලේකම් - කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රාදේශීය සංවිධානය
ගාල්ල/මාතර/කළුතර/කෑගල්ල/මහනුවර/නුවරඑළිය/බණ්ඩාරවෙල/රත්නපුර